# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,286 — 1961 පෙබරවාරි 10 වැනි සිකුරාද — 1961.2.10

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරණ ලදී.)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

අ. ආ. කා අංකය : සී. 134/48.

**1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජ සභා ආඥව සහ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥව**

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ, මාතලේ කොට්ඨාශය වෙනුවෙන් පෙනී සිටි මන්ත්‍රීවරයාගේ ආසනය පුරප්පාඩුවී ඇති බව, 1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජ සභා ආඥවේ 24(2) වැනි වගන්තිය අනුව, නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සංවිධායක ලිපිකරු විසින්, 1961 ජනවාරි මස 24 වැනි දින දරූ ලියමනෙන් මා වෙත දන්වා එවා තිබේ.

එසේ හෙයින්, අග්‍රාණ්ඩුකාර තැන්පත්, ඔලිවර් අර්නස්ට් ගුණතිලක වන මම, ඉහතකී වගන්තියෙන් සහ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥවේ 27 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව,

(1) ඉහතකී පුරප්පාඩුව පිරවීම පිණිස මැතිවරණයක් පැවැත්විය යුතු බවට මෙම දන්වීමෙන් අණ කරමි.

(2) තවද එම මැතිවරණය සඳහා අපෙක්ෂකයන්ගේ නාම යෝජනා භාර ගැනීමේ දිනය, 1961 මාර්තු මස 1 වැනි දින හැටියටත්, ස්ථානය, මාතලේ කච්චේරිය හැටියටත්, මෙයින් නියම කරමි.

ඕ. ඊ. ගුණතිලක,
අග්‍රාණ්ඩුකාර තැන.

1961 පෙබරවාරි මස 8 වැනි දින,
කොළඹ දී ය.


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරණ ලදී.

103—ජෙ. ඇන්. ආර් 15550—4,200 (61/2)